# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல்மாகாண மாகாணசபை
## Provincial Council - Western Province

**1989 අංක 01 දරණ බස්නාහිර පළාතේ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය.**

බස්නාහිර පළාතේ පළාත් සභාවෙහි සභාපතිවරයාට හා නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතු වැටුප් හා දීමනා සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක කිරීමේ දිනය*

1. මෙම ප්‍රඥප්තිය 1989 අංක 01 දරණ බස්නාහිර පළාතේ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය වශයෙන් හැඳින්වෙනු ලබන අතර, පළාතේ ආණ්ඩුකාරවරයාගේ එකඟත්වය ලැබුනු දිනයෙහි පටන් ක්‍රියාත්මක වනු ඇත.

*සභාපතිවරයාට සහ නියෝජ්‍ය සභාපති-වරයාට ගෙවියයුතු වැටුප් හා දීමනා*

2. මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමේ දිනයෙහි සිට එතින් පසුව පළාත් සභාවේ සභාපතිවරයාට හා නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතු මාසික වැටුප හා වෙනත් සියලු දීමනාවන් පහත සඳහන් පරිදි වේ. එනම් :-

   (අ). පළාත් සභාවේ සභාපතිවරයාට ගෙවිය යුතු මාසික වැටුප හා වෙනත් සියලු දීමනාවන් පළාත් සභාවේ අමාත්‍ය වරයෙකුට දැනට ගෙවනු ලබන මාසික වැටුප හා වෙනත් සියලු දීමනාවනට සමාන විය යුතු අතර,

/...

(ආ). පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතු මාසික වැටුප හා දීමනා අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකුගේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට දැනට ගෙවනු ලබන මාසික වැටුප් හා වෙනත් සියළු දීමනා වලින් 50% කට සමාන විය යුතුය.

වැටුප් හා දීමනා පළාතේ පළාත්සභා අරමුදලට වැය බරක් වනවියදමක් විය යුතු බව.

3. මෙම ප්‍රඥප්තිය යටතෙහි පළාත් සභාවෙහි සභාපතිවරයාට හෝ නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතු වැටුප් හා දීමනා පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන වියදමක් වන්නේය.

---

1989.01.18 දින සභා සම්මත වූ බව සහතික කරමි.

K. Perera

Recommended
S. Sharvananda
9/5/89

S. SHARVANANDA